සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

## තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2024
## Third Term Test - Grade 13 - 2024

විභාග අංකයඃ ....................................

## සාමාන්‍ය පොදු පරීක්ෂණය

කාලය පැය 02 යි

- **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **අංක 01 - 50 තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරාගෙන එය උත්තර පත්‍රයේ කතිර ලකුණ (X) යොදා දක්වන්න.**

---

(01) ශ්‍රී ලංකාවේ ජාතික කොඩියේ කඩුව අතින් ගත් සිංහයාට පසුබිමෙහි ඇති රතු පැහැයෙන් නිරූපණය වන්නේ පහත ඒවායින් කුමක් ද?
(1) දෙමළ ජනවර්ගයා
(2) මුස්ලිම් ජනවර්ගයා
(3) මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ෂා යන සතර බ්‍රහ්මවිහරණ
(4) සිංහල ජාතියේ එඩිතර බව
(5) ජාතික අභිමානය (......)

(02) වයඹ පළාතේ, පළාත් පුෂ්පය ලෙස නම් කර ඇත්තේ පහත කුමන පුෂ්පය ද?
(1) ඇට්ටේරියා මල (2) ඇසළ මල (3) ගුරුළුරාජ මල
(4) මහරත් මල (5) වෙසක් මල (......)

(03) 2013 වර්ෂයේ දී තිරගත වූ සිරිපැරකුම් චිත්‍රපටිය අධ්‍යක්ෂණය කළේ කවුරුන් ද?
(1) ලෙස්ටර් ජේම්ස් පීරිස් (2) සෝමරත්න දිසානායක (3) ටයිටස් තොටවත්ත
(4) පරාක්‍රම නිරිඇල්ල (5) ගිරිරාජ් කෞශල්‍ය (......)

(04) ශ්‍රී ලංකාවේ වර්තමාන ජපන් තානාපති වන්නේ පහත කවුරුන් ද?
(1) ජුලි චංගේ මහත්මිය (2) ගෝපාල් බග්ලයි මහතා (3) මිසුකොෂි හිඩේකි මහතා
(4) ෂොල් ස්ටෙපන් මහතා (5) වොන්ජින් ජියොන් මහතා (......)

(05) මොරගහකන්ද ජලාශයට අතිරේක ජලය සැපයෙන්නේ,
(1) අඹන් ගඟෙනි (2) කළු ගඟෙනි (3) මහවැලි ගඟෙනි
(4) ඇලහැර ඇලෙනි (5) වළවේ ගඟෙනි (......)

(06) තිස්සමහාරාමය අයත් වන්නේ පහත කුමන දිස්ත්‍රික්කයට ද?
(1) කතරගම (2) මාතර (3) ගාල්ල (4) හම්බන්තොට (5) මොනරාගල (......)

(07) ශ්‍රී ලංකාවේ පළමු ටෙස් ක්‍රිකට් නායකයා වන්නේ,
(1) රංජන් මඩුගල්ල (2) සිදත් වෙත්තමුනි (3) බන්දුන වර්ණපුර
(4) දුලීප් මෙන්ඩිස් (5) අර්ජුන රණතුංග (......)

(08) ශ්‍රී ලංකාවේ දරුවන්ට සිදුවන ළමා අපයෝජන සම්බන්ධ පැමිණිලි ඉදිරිපත් කිරීම සඳහා ළමා ආරක්ෂණ අධිකාරිය පිහිටුවා ඇත. මෙම ආයතනය ඇමතීම සඳහා වන ගාස්තු රහිත අංකය කුමක් ද?
(1) 1919 (2) 1980 (3) 1929 (4) 1908 (5) 1991 (......)

(09) ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව තානාපතිවරයන්, මහකොමසාරිස්වරයන් පූර්ණාධිකාරී රාජ්‍ය දූතයන් හා වෙනත් තානාපති නියෝජිතයන් පත්කිරීම, ඔවුනට බලතල පැවරීම හා ඔවුන් පිළිගැනීම, බලය ඇත්තේ,
(1) ජනාධිපතිවරයාට (2) අග්‍රාමාත්‍යවරයාට (3) කථානායකවරයාට
(4) විපක්ෂ නායකවරයාට (5) සභානායකවරයාට (......)

(10) මධ්‍යධරණීය මුහුදේ නැගෙනහිර වෙරළේ පිහිටි බටහිර ආසියානු කලාපයට අයත් රටකි ඊශ්‍රායල් රාජ්‍යය. එහි දේශ සීමාවන්ට අයත් නොවන රාජ්‍යයක් වන්නේ පහත කුමන රාජ්‍යය ද?

(1) ලෙබනනය (2) සිරියාව (3) ජෝර්දානය (4) ඊජිප්තුව (5) බංගලාදේශය (......)

(11) නයන මහතා වාර්ෂිකව 8% සුළු පොළියට රු. 30000 ක් එක්තරා මූල්‍ය ආයතනයක තැන්පත් කර ඇත. ඔහුට රු. 37200 මුදලක් ලබාගත හැකි වන්නේ කොපමණ කාලයකට පසුව ද?

(1) වසර 01 (2) වසර 02 (3) වසර 03 (4) වසර 04 (5) වසර 05 (......)

(12) එක්තරා දුම්රියක් $72\ kmh^{-1}$ ක වේගයෙන් ගමන් කරයි. මෙම දුම්රියට සංඥා කණුවක් පසු කිරීමට තත්පර 10 ක් ගත වේ නම් දුම්රියේ දිග කොපමණ ද?

(1) 100 m (2) 150 m (3) 200 m (4) 250 m (5) 300 m (......)

(13) ඕවර් 50 ක ක්‍රිකට් තරගයක, ජය ලැබීමේ ඉලක්කය ලකුණු 276 කි. පළමු ඕවර් 10 අවසානයේ ලකුණු රැස්කිරීමේ වේගය 4.4 ක් විය. ඉතිරි ඕවර් 40 අවසානයේ ඉලක්කයට ළඟා වීමට අවශ්‍ය අවම ලකුණු රැස් කළ යුතු වේගය කුමක් ද?

(1) 4.4 (2) 4.8 (3) 5.4 (4) 5.8 (5) 6.2 (......)


(14) එක්තරා ගොවිපොළක ගවයන් 16 ක් සඳහා දින 12 කට ප්‍රමාණවත් ආහාර ගබඩා කර ඇත. දින දෙකකට පසු ගවයන් 6 ක් මෙම ගොවිපොළෙන් ඉවත්කර ගන්නා ලදී. ගබඩාකර ඇති ආහාර ප්‍රමාණය ඉතිරි ගවයන් සඳහා අමතර දින කීයකට ප්‍රමාණවත් වේද?

(1) 6 (2) 5 (3) 4 (4) 3 (5) 2 (......)

(15) ලීටරයක මිල රු. 600 හා රු. 800 බෙහෙත් තෙල් වර්ග දෙකක් 3:2 අනුපාතයට මිශ්‍රකර සෑදූ ඖෂධීය බෙහෙත් තෙල් මිශ්‍රණයේ ලීටරයක නිෂ්පාදන වියදම සොයන්න.

(1) රු. 680 (2) රු. 720 (3) රු. 880 (4) රු. 1000 (5) රු. 1400 (......)

(16) මෙම රූපයේ ඇති ත්‍රිකෝණ ගණන සොයන්න.




(1) 5 (2) 6

(3) 7 (4) 8

(5) 9 (......)


(17) පැත්තක දිග 30 cm වන සවිධි ෂඩාස්‍ර හැඩැති බිම් ඇතුරුම් ගල් 17 ක් රූපයේ දැක්වෙන සේ අතුරා එක් පෙළට ඇත. එහි පරිමිතිය සොයන්න.



(1) 18 m (2) 19 m (3) 20 m

(4) 21 m (5) 22 m (......)

(18) තරම $1\ m^3$ වන ඝනක හැඩැති පෙට්ටි 6 ක් රූපයේ දැක්වෙන සේ පොළව මත අසුරා ඇත. එහි නිරාවරණය වූ මුළු පෘෂ්ඨය මත තීන්ත ආලේප කර ඇත්නම් තීන්ත ආලේප කර ඇති මුළු පෘෂ්ඨ වර්ගඵලය කොපමණ ද?



(1) $21\ m^2$ (2) $22\ m^2$


(3) $23\ m^3$ (4) $24\ m^2$

(5) $25\ m^2$ (......)

(19) දැන් පියකුගේ වයස සිය පුතාගේ වයස මෙන් තුන් ගුණයකි. වසර 5 කට ඉහත දී පියාගේ වයස පුතාගේ වයස මෙන් හතර ගුණයකි. පුතාගේ දැන් වයස කීයද?

(1) අවු. 8 (2) අවු. 10 (3) අවු. 12 (4) අවු. 15 (5) අවු. 18 (......)

(20) රූපයේ දක්වා ඇත්තේ එක්තරා බිත්ති සැරසිල්ලක මල්පෙති හතරක් අඳුරුකර ඇති ආකාරයයි. එක් මල්පෙත්තක පරිමිතිය 44 කි. මෙහි මල් පෙති හතර වටා 5.5 cm පරතරය ඇතිව බොත්තම් ඇල්ලීමට අවශ්‍ය බොත්තම් ගණන සොයන්න.



(1) 33 (2) 32 (3) 31
(4) 30 (5) 29 (......)

(21) එක්තරා මිනිසෙකු සුළු වරදකට විනිසුරු ඉදිරියට ගෙන එන ලදී. ඔහුගේ නඩුව වෙනුවෙන් පෙනී සිටි නීතිඥයා විනිසුරුට මෙසේ කීවේ ය. ''ස්වාමීනි චූදිතයා වෙනුවෙන් අනුකම්පා කරනු මැනවි. ඔහු ඔහුගේ දෙමාපියන්ගේ එකම පුත්‍රයා වන අතර ඔහු මාගේ එක කුස උපන් සහෝදරයා ද වේ.'' මේ අනුව චූදිත මිනිසාට නීතිඥවරයාගේ ඇති සම්බන්ධය කුමක් ද?

(1) පියා (2) මව (3) පුත්‍රයා (4) සහෝදරිය (5) සහෝදරයා (......)

(22) නදීර, සචිනිට වඩා අවුරුදු 10 ක් බාලය. අවුරුදු 10 ක් ගතවීමෙන් පසු පහත කුමක් සිදුවිය හැකි ද?

(1) ඔවුන්ගේ වයස් අතර අනුපාතය නොවෙනස් වේ.
(2) ඔවුන්ගේ වයස් අතර අනුපාතය ඉහළ යනු ඇත.
(3) ඔවුන්ගේ වයස් අතර අනුපාතය පහළ යනු ඇත.
(4) ඔවුන්ගේ වයස් අතර වෙනස ඉහළ යනු ඇත.
(5) ඔවුන්ගේ වයස් අතර වෙනස පහළ යනු ඇත. (......)

- **අංක 23 හා 24 ප්‍රශ්නවල පද පහක් බැගින් දී ඇත. ඒවා අතරින් එකක් අනෙක්වාට වඩා කිසියම් ලක්ෂණයක් අනුව වෙනස් ය. එම වෙනස් ලක්ෂණය සහිත පදය තෝරන්න.**

(23) (1) මුං (2) කවුපි (3) මෑ (4) බෝංචි (5) මුරුංගා (......)

(24) (1) අනුරාධපුරය (2) සීගිරිය (3) තලවිල (4) කතරගම (5) ශ්‍රී පාදස්ථානය (......)

- **අංක 25, 26, සහ 27 ප්‍රශ්න පහත ජාලය මත පදනම් වේ.**

එක් එක් සිරස් පේළියක, එක් එක් තිරස් පේළියක හා 3 x 3 කොටුවක් තුළ A, B, C, D, E, F, G, H හා I යන අක්ෂර එක් වරක් පමණක් අඩංගු වන පරිදි මෙම ජාලය සම්පූර්ණ කළ යුතු වේ.

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| H | I | D | C | F | E | A | G | B |
| F | B | G | ② | | I | D | E | C |
| C | A | E | | | G | H | F | I |
| I | G | ① | | E | D | B | ③ | |
| E | F | | | H | C | I | | |
| D | H | A | ④ | | B | F | C | E |
| G | D | H | | | F | C | B | A |
| B | E | I | D | C | A | G | H | F |
| A | C | F | G | B | H | E | I | D |

(25) (1) යොදා ඇති කොටස විය යුත්තේ,

(1) C F / B A (2) F C / A D (3) F E / C A (4) G C / F B (5) B C / F C (......)


(26) අංක (2) යොදා ඇති කොටස විය යුත්තේ,


(1) H A / D B (2) A H / B D (3) A H / D B (4) A H / B D (5) H A / B D (......)

(27) අංක (3) යොදා ඇති කොටස විය යුත්තේ,

(1) A A / D G (2) A H / D G (3) B H / I D (4) B A / I D (5) H A / G D (......)


(28) රටාව අධ්‍යනය කර හිස්තැනට ගැළපෙන රූපය තෝරන්න.






(......)

(29) පහත දී ඇති කුමන ඝනකය, දී ඇති පතරමෙන් සෑදිය නොහැකි ද?



(......)



- **ප්‍රශ්න අංක 30, 31 හා 32 පහත දක්වා ඇති ගැටලුව මත පදනම් වේ.**
  - ⋆ එක්තරා මාසයට දින 31 ඇත.
  - ⋆ මෙම මාසයේ පළමු සතියට අයත් වන්නේ එම මාසයේ දින වලින් 5 ක් පමණක් වන අතර එම දිනවල අංක වල එකතුව 15 වේ.
  - ⋆ සතිය ඇරඹෙන්නේ සඳුදා වකිනි.

(30) මෙම මාසයේ පළමු වැනිදා යෙදෙන්නේ කවර දවසකට ද?

(1) සඳුදා (2) අඟහරුවාදා (3) බදාදා (4) සෙනසුරාදා (5) ඉරිදා (......)

(31) මෙම මාසයේ ඇති සති අන්ත දින (සෙනසුරා, ඉරිදා) ගණන කීයද?

(1) 7 (2) 8 (3) 9 (4) 10 (5) 11 (......)

(32) මෙම මාසයේ පසළොස්වක පෝය දිනය 9 වැනි දා නම්, එම දවස කුමක් ද?

(1) බ්‍රහස්පතින්දා (2) සිකුරාදා (3) සෙනසුරාදා (4) ඉරිදා (5) සඳුදා (......)

- **ප්‍රශ්න අංක 33, 34 හා 35 ප්‍රශ්න පහත විස්තරය මත පදනම් වේ.**

පාසලේ සාහිත්‍ය සමිතියේ අනිල්, නීලා, කුමාර, සමන් හා ගීතිකා, සභාපති, ලේකම්, උප සභාපති, උප ලේකම් හා භාණ්ඩාගාරික යන තනතුරු දරණ අතර ඔවුන් තනතුරු පිළිවෙළින් සඳහන් කර නොමැත. නීලා විසින් පසුගිය සමිතිවාරයේ වාර්තාව කියවූ අතර, ඉන් අනතුරුව සමිති වාරයේ වැඩිම වේලාවක් කථා කළේ උප සභාපති කුමාර වේ. සමිති වාරයේ අඩුවෙන්ම කතා කළේ භාණ්ඩාගාරික අනිල් වන අතර සමන්ගේ ස්තුති කථාවෙන් පසු සාහිත්‍ය සමිති වාරය අවසන් කළේ ය.

(33) මෙම සමිතියේ ලේකම් තනතුර දරන්නේ කවුරුන් ද?

(1) අනිල් (2) නීලා (3) කුමාර (4) සමන් (5) ගීතිකා (......)


(34) මෙම සාහිත්‍ය සමිතියේ සභාපති තනතුර දරන්නේ කවුරුන් ද?

(1) අනිල් (2) නීලා (3) කුමාර (4) සමන් (5) ගීතිකා (......)

(35) මෙම සාහිත්‍ය සමිතියේ ගීතිකාගේ තනතුර කුමක් ද?

(1) සභාපති (2) ලේකම් (3) භාණ්ඩාගාරික (4) උප සභාපති (5) උප ලේකම් (......)

- ප්‍රශ්න අංක 36 සහ 37 පහත වෙන් රූප මත පදනම් වේ. එක් එක් ප්‍රකාශයට ගැළපෙන වෙන් රූපය තෝරන්න.



1 2 3 4 5

(36) පාසලක ශිෂ්‍ය නායකයන්, මලල ක්‍රීඩකයින්, උසස් පෙළ සිසුන්,


(1) 1 (2) 2 (3) 3 (4) 4 (5) 5 (......)

(37) මිනිසුන්, උපාධිධාරීන්, ගුරුවරුන්,

(1) 1 (2) 2 (3) 3 (4) 4 (5) 5 (......)

- **පහත ප්‍රශ්න අංක 38, 39 හා 40 පහත ප්‍රස්තාරය මත පදනම් වේ.**

පහත ප්‍රස්තාරය 2018 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා එක්තරා විශ්ව විද්‍යාලයක නීති පීඨයට අයදුම් කළ අයදුම්කරුවන් (පිරිමි හා ගැහැනු) සංඛ්‍යාවන් ය.




(38) පිරිමි අයදුම්කරුවන් සංඛ්‍යාව හා ගැහැනු අයදුම්කරුවන් සංඛ්‍යාව අතර අඩුම වෙනස ඇත්තේ කිනම් අවුරුද්දේ ද?

(1) 2018 (2) 2020
(3) 2021 (4) 2022
(5) 2023 (......)

(39) පිරිමි අයදුම්කරුවන් සංඛ්‍යාව හා ගැහැනු අයදුම්කරුවන් සංඛ්‍යාව අතර 7:6 අනුපාතයක් ඇත්තේ කිනම් වසරේ ද?

(1) 2019 (2) 2020 (3) 2021 (4) 2022 (5) 2023 (......)

(40) 2018 සිට 2023 දක්වා කාලය තුළ අයදුම් කළ පිරිමි අයදුම් කරුවන් සංඛ්‍යාව මුළු පිරිසෙන් කවර ප්‍රතිශතයක් ද?

(1) 50.0% (2) 52.7% (3) 47.2% (4) 62.7% (5) 48.7% (......)

- **ප්‍රශ්න අංක 41 සහ 42 ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීමට පහත දී ඇති සංඥා අධ්‍යයනය කරන්න.**



A B C D E

(41) a සිට d දක්වා ඇති ප්‍රකාශ අනුපිළිවෙළින් නිරූපණය කරන සංඥාවලට අනුව ඉංග්‍රීසි අක්ෂර පෙළ ගස්වන්න.

a - පදිකයන් මාරුවෙන ස්ථානය
b - ඉදිරියෙන් මාර්ගය පටය
c - පටු පාලස ඉදිරියෙන්
d - අන්තරාදායක බෑවුම ඉදිරියෙන්

(1) ABCD (2) ABDE (3) AECD (4) ACDE (5) ADCE (......)

(42) ඉදිරියෙන් මාර්ගය පටු පාර හා ඉදිරියෙන් පටු පාලම යන සංඥා දෙක දැක්වෙන්න,

(1) B හා C (2) C හා D (3) D හා E (4) A හා E (5) B හා E (......)

(43) කිසියම් සිද්ධියකට අදාළ පින්තූර 6 ක් පහත දී ඇත. පින්තූර නිවැරදි අනුපිළිවෙළට පෙළගස්වන වරණය තෝරන්න.




(1) ABCDEFGHI (2) EGBDCAIFH (3) GDBAIEFCH

(4) ABDGHCIEF (5) ECHDFBAIG (......)

- **ප්‍රශ්න අංක 44 හා 45 පහත ඡේදය මත පදනම් වේ.**

රෝම ලන්දේසි නීතිය යටතේ ස්වාමි පුරුෂයා හා භාර්යාව අතර පෝෂණය කිරීමේ වගකීම අන්‍යෝන්‍ය වුවද නඩත්තු කිරීමේ මූලික වගකීම ස්වාමි පුරුෂයා මත පැවරිණි. මෙම වගකීම ඉස්මතු වූයේ පවුල් ඒකකයේ ප්‍රධානියා වශයෙන් ඔහුගේ තත්වය තුළිණි. ඔහු බිරිඳ හා දරුවන් නඩත්තු කිරීම ප්‍රතික්ෂේප කළහොත් ඔහුට එරෙහිව නඩත්තු ඉල්ලා සිටීමට ඔවුනට හැකි විය. මෙම නෛතික තත්වය බිරිඳ හා දරුවන් නඩත්තු කිරීමේ වගකීම ස්වාමි පුරුෂයා වෙත පැවරූ ව්‍යවස්ථාපිත විධිවිධාන මගින් තවදුරටත් ශක්තිමත් කරන ලදී. මෙම ව්‍යවස්ථාපිත වගකීම මූල්‍ය ආදායමක් නොමැති එහෙත් ඉපයීමේ හැකියාව ඇති නමුත් සිතාමතා එසේ කිරීමෙන් වැලකී සිටින ස්වාමි පුරුෂයකුට එරෙහිව පවා ක්‍රියාත්මක කළ හැකි විය. අත්හැර දමනු ලැබූ භාර්යාවකට රෝම ලන්දේසි නීතිය යටතේ අවශ්‍ය දෑ මිල දී ගැනීම සඳහා සැමියා නමින් ණයට බඩු ගැනීමට හෝ මේ සඳහා මුදල් ණයට ගැනීමට හැකි විය. තමාගේ වැරැද්දක් නිසා පොදු නිවස බිඳී යාමෙන් පසුව පවා අවශ්‍ය දෑ සැපයීම සැමියා යටත් වූ බව සිවහකියම් ඒ නවමනි අම්මාල් නඩුවේදී අධිකරණය තීරණය කළේ ය. ආහාර හා ඇඳුම් වැනි දෑ මිලට ගැනීම වැනි ගෙදර දොර කළමනාකරණය සම්බන්ධ කරුණුවල දී තමා හා තම සැමියා බන්ධනයට ලක්කරමින් ගිවිසුම්වලට එළඹීමට රෝම ලන්දේසි නීතියට අනුව භාර්යාවට හැකි බව ලාල්වන්ඩ් ඒ. සරවනමුත්තු නඩුවේදී අධිකරණය තීරණය කළේ ය.

(44) මෙම ඡේදයෙන් කියැවෙන මුඛ්‍ය අදහස වන්නේ,

(1) රෝම ලන්දේසි නීති විධානයේ ආධිපත්‍යය පිළිබඳව.

(2) රෝම ලන්දේසි නීතිය අනුව විවාහ ගිවිස ගත් පසු ස්වාමියාට ඇති වගකීම පිළිබඳව.

(3) රෝම ලන්දේසි නීතිය යටතේ විවාහ ගිවිස ගත් පසු භාර්යාවට ලැබෙන අයිතිවාසිකම් පිළිබඳව.

(4) රෝම ලන්දේසි නීතිය යටතේ විවාහ ගිවිසගෙන භාර්යාව අත් හැර යන සැමියාට ලැබෙන දඬුවම් පිළිබඳව.

(5) බිරිඳ හා දරුවන් අත්හැර ගිය පසු බිරිඳ විසින් ස්වාමියාට නඩු පැවරිය යුතු ආකාරය පිළිබඳව. (......)

(45) ලාල්වන්ඩ් ඒ. සරවනමුත්තු නඩුවේ තීරණය කුමක් ද?

(1) ස්වාමි පුරුෂයා හා භාර්යාව අතර පෝෂණය කිරීමේ වගකීම අන්‍යෝන්‍ය වේ.

(2) බිරිඳ හා දරුවන් පෝෂණය කිරීම ප්‍රතික්ෂේප කළ සැමියා වෙනුවෙන් බිරිඳට නඩු ඉල්ලා සිටිය හැකි බව.

(3) පොදු නිවාස බිඳීයාමකදී අවශ්‍ය දේ සැපයීමට සැමියා බැඳී සිටින බව.

(4) ආහාර ඇඳුම් වැනි දෑ මිලට ගැනීම, ගේ දොර කළමනාකරණ කටයුතු සම්බන්ධ ව තම සැමියා බන්ධනයට ලක්කරමින් ගිවිසුම් වලට එළඹිය හැකි බව.

(5) බිරිද අත්හැර දමූවත් විවිධ වගකීම් වලට සැමියා බැඳී සිටින බව. (......)

- **ප්‍රශ්න අංක 46 සහ 47 ප්‍රශ්න සඳහා ගැටලුවක් හා A හා B ප්‍රතිචාර දෙකක් ඇත. ඔබේ ප්‍රතිචාරය පහත දක්වා ඇති උපදෙස් පරිදි තෝරන්න.**

  - ⋆ විසඳුම සොයා ගැනීම සඳහා A ප්‍රකාශය පමණක් ප්‍රමාණවත් නම් 1 වන ප්‍රතිචාරය තෝරන්න.
  - ⋆ විසඳුම සොයා ගැනීම සඳහා B ප්‍රකාශය පමණක් ප්‍රමාණවත් නම් 2 වන ප්‍රතිචාරය තෝරන්න.
  - ⋆ විසඳුම සොයා ගැනීම සඳහා A හා B ප්‍රකාශ දෙකම අවශ්‍ය නම් 3 ප්‍රතිචාරය තෝරන්න.
  - ⋆ විසඳුම සොයා ගැනීමට A හා B ප්‍රකාශ වෙන වෙනම අවශ්‍ය නම් 4 ප්‍රතිචාරය තෝරන්න.
  - ⋆ A හා B ප්‍රකාශවලින් සපයන තොරතුරු විසඳුම සොයා ගැනීමට ප්‍රමාණවත් නොවේ නම් 5 ටම ප්‍රතිචාරය තෝරන්න.

(46) හසිනිගේ වයස කීයද?

A - හසිනි, හුසේන් හා හන්සන යන මිතුරන් තිදෙනාගේ වයස් වල එකතුව 67 කි.

B - හුසේන්ගේ වයස, හසිනිගේ වයසට වඩා අවුරුදු 4 ක් අඩු වන අතර හසිනිගේ වයස හන්සනගේ වයසට වඩා අවුරුදු 5 ක් අඩුවේ.

(1) 1 (2) 2 (3) 3 (4) 4 (5) 5 (......)

(47) අබිලා සහ සුවිමාලි අතරින් වඩා උස කවු ද?

A - අබිලා නිමාලිට වඩා උස වන අතර නාමලීට වඩා මිටි වේ.

B - සුවිමාලි නිමාලිට වඩා උස වන අතර නාමලී ට වඩා මිටි වේ.

(1) 1 (2) 2 (3) 3 (4) 4 (5) 5 (......)

(48) A සිට F තෙක් නම් කරන ලද ප්‍රකාශ 6 ක් වේ. ඒවායින් 3 ක් කාලානුරූපයට අනුපිළිවෙළින් සංවිධානය කළ හැකි ය. එම ප්‍රකාශ තුන කාලානුරූප පිළිවෙළින් දැක්වෙන අක්ෂර අඩංගු වරණය තෝරන්න.

A - සනත් වෛද්‍යවරයෙකි.

B - සනත්ගේ පියා විදේශ රටක තම මව සමඟ ජීවත් වෙයි.

C - නසාර් සනත් සමඟ බැඩ්මින්ටන් ක්‍රීඩා කරයි.

D - සනත්ගේ දරුවෝ ද සමහර විට ඔවුන් සමඟ බැඩ්මින්ටන් ක්‍රීඩා කරයි.

E - නසාර් ඉරිදා දිනවල සවස් කාලයේ සනත්ගේ නිවසට යයි.

F - සනත්ගේ භාර්යාව ගුරුවරියකි.

(1) BFA (2) ECD (3) AEB (4) CED (5) FBA (......)

- **ප්‍රශ්න අංක 49 හා 50 පාසලේ පංතිභාර ගුරුතුමිය සහ සිසුන් අතර සිදුවන සංවාදයක කොටසක් අනුපිළිවෙළින් තොරව සඳහන් වේ.**

A - අද හැමෝම ඇවිල්ල ද ඉන්නේ.... කෝ පංති නායිකාව?

B - හොඳයි ටීචර්.

C - එයාලත් අසනීප වෙලාද, ළමයි මේ දවස්වල වෛරස් උණ හැමතැනම පැතිරෙනවා ඒ නිසා ඔයාලත් පරිස්සම් වෙන්න ඕන.

D - හොඳයි, එහෙනම් අද පාඩමට ලෑස්ති වෙන්නකෝ.

E - සමීරයි, නිමලුයි, නදීෂාත් නෑ. ආ.. .ආකාශත් නෑ ටීචර්.

F - ටීචර්. මමත් දැක්කා සඳුනි අම්මත් එක්ක ඊයේ හවස බෙහෙත් ගන්න යනවා.

G - සඳුනිට අසනීප වෙලා ටීචර්.

H - ආයුබෝවන් දරුවනේ.

I - ආයුබෝවන් ටීචර්.

J - සඳුනි විතරද ඇවිත් නැත්තේ.

(49) සංවාදය වඩාත් තර්කානුකුල පිළිවෙළ දැක්වෙන වරණය තෝරන්න.

(1) HIAEFJGCBD (2) HIACEDGFJE (3) ABCDFGHIJE

(4) DBCEJFGAIH (5) HIAGFJECBD (......)

(50) පංති නායිකාව සඳුනි බව කියැවෙන ප්‍රකාශය කුමක් ද?

(1) A (2) F (3) E (4) G (5) J (......)

සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved



වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## තෙවන වාර පරීක්ෂණය - 2024

**13 ශ්‍රේණිය** — **සාමාන්‍ය පොදු පරීක්ෂණය** — **පිළිතුරු පත්‍රය**

### I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| (1 ) 5 | (2 ) 1 | (3 ) 2 | (4 ) 3 | (5 ) 1 | (6 ) 4 | (7 ) 3 | (8 ) 3 | (9 ) 1 | (10) 5 |
| (11) 3 | (12) 3 | (13) 4 | (14) 1 | (15) 1 | (16) 4 | (17) 4 | (18) 1 | (19) 4 | (20) 5 |
| (21) 4 | (22) 2 | (23) 5 | (24) 2 | (25) 1 | (26) 2 | (27) 2 | (28) 1 | (29) 2 | (30) 3 |
| (31) 2 | (32) 1 | (33) 2 | (34) 4 | (35) 4 | (36) 1 | (37) 2 | (38) 3 | (39) 5 | (40) 2 |
| (41) 5 | (42) 2 | (43) 2 | (44) 2 | (45) 4 | (46) 3 | (47) 5 | (48) 2 | (49) 5 | (50) 4 |

සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

01

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

තෙවන වාර පරීක්ෂණය - 2024

13 ශ්‍රේණිය — සාමාන්‍ය පොදු පරීක්ෂණය — පිළිතුරු පත්‍රය

I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| (1 ) 5 | (2 ) 1 | (3 ) 2 | (4 ) 3 | (5 ) 1 | (6 ) 4 | (7 ) 3 | (8 ) 3 | (9 ) 1 | (10) 5 |
| (11) 3 | (12) 3 | (13) 4 | (14) 1 | (15) 1 | (16) 4 | (17) 4 | (18) 1 | (19) 4 | (20) 5 |
| (21) 4 | (22) 2 | (23) 5 | (24) 2 | (25) 1 | (26) 2 | (27) 2 | (28) 1 | (29) 2 | (30) 3 |
| (31) 2 | (32) 1 | (33) 2 | (34) 4 | (35) 4 | (36) 1 | (37) 2 | (38) 3 | (39) 5 | (40) 2 |
| (41) 5 | (42) 2 | (43) 2 | (44) 2 | (45) 4 | (46) 3 | (47) 5 | (48) 2 | (49) 5 | (50) 4 |